*සැ. යු.* - 2023.06.09 දින පළ කරන ලද අංක 2,336 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,337 - 2023 ජුනි මස 16 වැනි සිකුරාදා - 2023.06.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(අා) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 704 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 706 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජූලි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 23 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

703- B 82465 — 5,403 (2023/06)

# පළාත් පාලන නිවේදන

## ඉපලෝගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉපලෝගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ දෙසැම්බර් මස 15 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බවත්, එකී පනතේ 134(1) උප වගන්තියෙහි පැවරී ඇති බලතල ප්‍රකාර අනුරාධපුර පළාත් පාලන සහකාර කොමසාරිස්වරිය විසින් එම යෝජනාව අනුමත කරන ලද බවත් මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩබ්. කුමාරි විජේසිංහ,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍යය ඉටුකරන නිලධාරි,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 22 වැනි දින,
ඉපලෝගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, පහත උපලේඛනයේ ඇතුළත් කර ඇති හා ඒ සමග විස්තර කෙරෙන සීමාවන් ඇතුළත පිහිටියා වූ ද ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට යෝජනා කරමි.

### උපලේඛනය

තලාව කැකිරාව ප්‍රධාන මාර්ගයේ මහඉලුප්පල්ලම නගර සීමාවේ සිට කොට්ටල්බද්ද සභා බල සීමාව දක්වා පිහිටි ප්‍රධාන මාර්ගයේ කෙලවර සිට අඩි 50 ක් දකුණුපසට හා වම්පසට ඇති පළමු පෙල නිවාස ද,

රණජයපුර මාර්ග බාධකයේ සිට රණජයපුර නිවාස සංකීර්ණයේ වම් පසින් ඇති (SMA/KDE/IEL/ANP/DLE) කලාපයන්හි ඇති 01 පටුමගේ සිට 29 පටුමග දක්වා ඇති සියලු නිවාස ද,

කළාවැව, හුංගාවිල, තෙලියාව, අමුණුවැටිය, කුසලානාගම, විජිතපුර නගර සීමාවේ ඇති පාර දෙපස අඩි 100ක සීමාවේ ඇති නිවාස පිහිටා ඇති ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි යෝජනා කරමි.

06-245

---

## වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව - චුන්නාකම්

පරිපාලන නියෝගය අංක : 27, 20/05/2023

2023/07/08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට අනුව සියලුම ගාස්තු අය කිරීමට 2023 ජුනි 01 දින සිට ක්‍රියාත්මක කිරීමට මට මෙයින් බලය පවරා ඇත.

සාරතා උරුතිරසම්බවන් මිය,
ලේකම්.

06-252

## සංශෝධනයයි

### තඹලගමුව ප්‍රාදේශීය සභාව

2023.04.28 වැනි දින පළකරන ලද අංක 2,330 *ගැසට් පත්‍රයේ* 04-302 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය :

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ විරෝධතා කැඳවීම.

**ග්‍රාම නිලධාරී වසම - පොට්කේනි - 228/1**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *මාර්ග යේ දිග* | *මාර්ගයේ පළල* | *GPS සලකුණු* | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | *ආරම්භක ස්ථානය* | | *අවසන් වන ස්ථානය* | |
| | | | | | | Start X co | Star Yco | End Xco | End Y co |
| 1 | ඉස්මායිල් වීදිය | නුවර වීදිය | සාහුල් හමීඩ් නිවස | 113 | 12 | 81.089520 | 8.490774 | 81.090231 | 8.490054 |
| 2 | මුත්තලීෆ් වීදිය | නුවර වීදිය | අල් ඉක්රා පෙර පාසල | 155 | 12 | 81.090013 | 8.491465 | 81.091219 | 8.490819 |
| 3 | මානික්කම් වීදිය | විපුලානන්තර් වීදිය | නල්ල තම්පි නිවස | 68 | 12 | 81.098002 | 8.495420 | 81.098379 | 8.495892 |
| 6 | කාර්තිකේසර් වීදිය | නුවර වීදිය | කාන්තිකේසර් නිවස | 88 | 12 | 81.093156 | 8.497688 | 81.093880 | 8.497372 |
| 9 | නාවලර් වීදිය | ප්‍රධාන වීදිය | තායිබ් නගර සීමාව | 1371 | 12 | 81.090850 | 8.487994 | 81.098442 | 8.497205 |
| 11 | විවේකානන්දර් වීදිය | නාවලර් වීදිය | වෙල්යාය | 686 | 12 | 81.097157 | 8.489234 | 81.095464 | 8.494918 |
| 14 | නාකවිනායකර් වීදිය | විවේකානන්දර් වීදිය | විවේකානන්දර් වීදිය | 235 | 12 | 81.095547 | 8.492768 | 81.095547 | 8.492768 |
| 19 | තම්පි අයියා වීදිය | විවේකානන්දර් වීදිය | තන්කමයිල් නිවස | 88 | 12 | 81.097179 | 8.489878 | 81.096401 | 8.490010 |
| 21 | පොට්කේනි ප්‍රධාන වීදිය | නාවලර් වීදිය | තඹලගමුව වීදිය | 1412 | 12 | 81.102377 | 8.492431 | 81.102377 | 8.492431 |
| 22 | කදිර් කාමත් තම්පි වීදිය | පොට්කේනි ප්‍රධාන වීදිය | කදිර්කාමත් තම්පි නිවස | 80 | 12 | 81.097153 | 8.494890 | 81.096719 | 8.494323 |
| 32 | 17 ඇල වීදිය | කලෙයිමකල් වීදිය | වෙල් යාය | 244 | 12 | 81.101607 | 8.488907 | 81.101566 | 8.486738 |
| 33 | 18 ඇල වීදිය | කලෙයිමකල් වීදිය | වෙල් යාය | 172 | 12 | 81.102718 | 8.489368 | 81.103054 | 8.487877 |
| 34 | 19 ඇල වීදිය | කලෙයිමකල් වීදිය | වෙල් යාය | 191 | 12 | 81.103040 | 8.490050 | 81.104309 | 8.488970 |
| 37 | කුලක්කොට්ටන් විද්‍යාලය වීදිය | පොට්කේනි ප්‍රධාන වීදිය | නාදපිරාන් කෝවිල | 265 | 12 | 81.104223 | 8.491513 | 81.103821 | 8.489476 |

බී. යූ. ඒ. එස්. උඩගෙදර,
ලේකම්,
තඹලගමුව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 09 වැනි දින.

06-366

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව

2022.11.18 දින පළ කරන ලද අංක 2307 *ගැසට් පත්‍රයේ* 11-342/10 නිවේදනයේ "සුසාන භූමි ආඥාපනත (231 වැනි අධිකාරය)"

ආදාහනාගාර ගාස්තු යටතේ -

සභා බල ප්‍රදේශය තුළ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා රු. 9,000.00 ක් ලෙස නිවැරදි විය යුතුය.

එම්. ඒ. එස්. ප්‍රනාන්දු,
ලේකම්,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 30 වැනි දින.

06-195/1

---

## සංශෝධනයයි

### වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව

2022.11.18 දින පළ කරන ලද අංක 2307 *ගැසට් පත්‍රයේ* 11-342/12 නිවේදනයේ "සේවා ගාස්තු අයකිරීම -2023 හි"

I උපලේඛනයේ -

13. ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු ඃ

නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම්/කොටස් එකතු කිරීම/නැවත ඉදි කිරීම

| ඉදි කිරීමේ අදියර 1 - | *නේවාසික ව. මී. 1ක් සඳහා ගාස්තු (රු.)* | *වානිජ හා වෙනත් ව. මී. 1ක් සඳහා ගාස්තු (රු.)* |
|---|---|---|
| අත්තිවාරම් වැඩ පමණක් (කයිරූ මට්ටම) සම්පූර්ණ කොට ඇති විට | 40.00 | 100.00 |
| වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇතිවිට | 60.00 | 200.00 |
| වහලය ඇතුළුව ඉදිකොට ඇතිවිට | 80.00 | 300.00 |
| සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 100.00 | 400.00 |

ලෙස සංශෝධනය විය යුතුය.

එම්. ඒ. එස්. ප්‍රනාන්දු,
ලේකම්,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 30 වැනි දින.

06-195/2

## සංශෝධනයයි

### වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව

2022.11.18 දින පළ කරන ලද අංක 2307 *ගැසට් පත්‍රයේ* 11-342/12 නිවේදනයේ "සේවා ගාස්තු අය කිරීම - 2023 හි "

උපලේඛන 7 හි -

පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තුව දිනකට රු. 50.00 ක් ලෙස සඳහන් වුවද එය එක් දිනකට එක් පොතක් සඳහා රු. 50.00 ක් ලෙස සශෝධනය කිරීමට 2023.02.21 දින රැස් වූ ගරු සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලද බැවින් 2023.02.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තුව දිනකට රු. 5.00 ලෙස සංශෝධනය විය යුතුය. එසේම 07 (i) හා (ii) ඉන් ඉවත් විය යුතු ය.

එසේම,

8. පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම - රු. 100.00

i. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම - පාසල් ළමුන් සඳහා රු. 50.00
ii. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම - වැඩිහිටි සාමාජිකයන් සඳහා රු. 100.00
iii. බල ප්‍රදේශයෙන් බැහැර සාමාජික තැන්පතුව රු. 1000.00 (ආපසු ගෙවනු ලබන)

ලෙස ද සංශෝධනය විය යුතුය.

එම්. ඒ. එස්. ප්‍රනාන්දු,
ලේකම්,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 30 වැනි දින.

06-195/3

---

## සංශෝධනයයි

### වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව

2022.11.18 දින පළ කරන ලද අංක 2307 *ගැසට් පත්‍රයේ* 11-342/10 නිවේදනයේ "සේවා ගාස්තු අය කිරීම - 2023 හි "

1 උපලේඛනයේ අංක II හි දැක්වෙන ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2023.05.25 දින රැස් වූ මුදල් කාරක සභාව විසින් ඒකමතිකව නිර්දේශ කරන ලද බැවින් 2023.05.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි එය පහත පරිදි සංශෝධනය විය යුතුය.

| නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි | *ගෙබිම් ප්‍රමාණය (ව.මී.)* | *නේවාසික (ව. මීටර් 01 කට)* | | *නේවාසික නොවන (ව. මීටර් 01 කට)* |
|---|---|---|---|---|
| | | *තනි පුද්ගල* | *මහල් නිවාස* | |
| | ව. මී. 400 දක්වා | රු. 20 | රු. 25 | රු. 25 |
| | ව. මී. 401 - 1,000 | රු. 22 | රු. 27 | රු. 27 |
| | ව. මී 1,001 - 1,500 | රු. 25 | රු. 30 | රු. 30 |
| | ව. මී. 1,501 - 2,000 | රු. 25 | රු. 32 | රු. 32 |
| | ව. මී 2,000ට වැඩි | වැඩිවන සෑම ව. මී. 90ක් සඳහා ම රු. 2,000 බැගින් | වැඩිවන සෑම ව. මී. 90ක් සඳහා ම රු. 2,000 බැගින් | වැඩිවන සෑම ව. මී. 90 ක් සඳහා ම රු. 2,000 බැගින් |

එම්. ඒ. එස්. ප්‍රනාන්දු,
ලේකම්,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 30 වැනි දින.

06-195/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.